අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.
Web : www.pmoffice.gov.lk

## <u>ග්‍රාමීය වෙළඳපල ක්‍රමය ක්‍රියාත්මක කිරීම</u>

අග්‍රාමාත්‍ය කර්යාලයෙහි පිහිටුවා ඇති ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලය මඟින් ග්‍රාමීය පොළවල් පිළිබඳ වෙබ් අඩවියක් දියත් කර ඇත.සිංහල භාෂාවෙන් 'පොළ' හා දෙමළ භාෂාවෙන් 'සන්දෛ' ලෙස හැඳින්වෙන වෙළඳපල ක්‍රමය, ශ්‍රී ලංකාවේ ගැමි දිවියෙහි වැදගත් කාර්ය භාරයක් ඉටු කරන්නාවූ සතිපතා පැවැත්වෙන වෙළඳපලකි. ප්‍රජාව විසින් එකිනෙකා මුණ ගැසෙනා ස්ථානයක් වන එය ගැමි ආර්ථිකයන්හි ප්‍රධාන අංගයක් වශයෙන්ද ක්‍රියාත්මක වේ. ප්‍රාථමික නිෂ්පාදකයන් විසින් සිදුවන විකුණුම් සහ බෙදාහරින්නන් විසින් රැගෙන එනු ලබන දේශීය නොවන නිෂ්පාදනයන්හි මිලදී ගැනීම් මඟින් ගැමි පොළවල සැලකිය යුතු තරම් වූ සිල්ලර වෙළඳාමක් සිදුවේ. ගැමි වෙළඳපල නවීකරණයට හා ඒවාහි ධාරිතාවය නංවාලීමට උපකාර කරමින්, දිවයින පුරා පිහිටි ගැමි ආර්ථිකයන් උත්තේජනය කරලීමට අදහස් කරයි.මෙම වෙබ් අඩවිය මගින්**(http://villagefair.pmoffice.gov.lk/)**ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම සඳහා දායකත්වය ලබාදීමට අවශ්‍ය පුද්ගලයන් සමඟ විශේෂයෙන් දිවයින පුරා පැතිරී ඇති ග්‍රාමීය ප්‍රජාවන් ඇතුළත් අත්‍යවශ්‍ය යටිතල පහසුකම් පිළිබඳ අවශ්‍යතාවයන්ගෙන් පෙළෙන ග්‍රාමීය වෙළඳපල සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සම්පාදනය කරයි. මෙම මූලාරම්භය,ආධාරක ආයතනවලට බොහෝ දෙනෙකුගේ ජීවිත වෙත සුවිශාල බලපෑමක් ඇති කරනු ඇත්තාවූ ශ්‍රී ලංකාවේ සූක්ෂම ව්‍යාපෘතීන් වෙත අරමුදල් ලබාදීමේ කාර්යය පහසු කිරීමේ අරමුණින් ගනු ලැබූවකි.නවීකරණය වූ එම ග්‍රාමීය වෙළඳපලවල අවශ්‍යතා ලැයිස්තුගත කෙරේ. අරමුදල් ආධාර ලබන්නා වූ ග්‍රාමීය වෙළඳපල ඒ ඒ සූක්ෂම ව්‍යාපෘතියෙහි ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කිරීමට බැඳී සිටී. පාරදෘශ්‍යභාවය උපරිම කරනු පිණිස අවසන් කරන ලද ක්ෂුද්‍ර ව්‍යාපෘතීන්හි ඡායාරූප වෙබ් අඩවිය වෙත උඩුගත (upload) කෙරෙනු ඇත.මේ දක්වා කොළඹ සහ මාතලේ දිස්ත්‍රික්කයන්හි සතිපොළ පිළිබඳ විස්තර මෙම වෙබ් අඩවියෙහි පල කර ඇත. ඉදිරියේදී, අනෙකුත් දිස්ත්‍රික්ක පිළිබඳ විස්තර මෙම වෙබ් අඩවියෙහි පලවූ පසු, මහජනතාව දැනුවත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම කර්තව්‍ය පිළිබඳ ප්‍රතිචාර සහ අදහස් අප වෙත ලියන්න. **(weeklyvillagefair@gmail.com)**



දුරකථන
தொலைபேசி
Telephones
2575317 - 18
2370737 - 38

ෆැක්ස්
தொலைநகல்
Fax
2575454
2575310
2574713

විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
E-mail
secpm@pmoffice.gov.lk
Info@pmoffice.gov.lk